www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බෙදීම්වලින් හා බෙලහීනත්වයෙන් සනිටුහන් කල ජී-8 සමුලුව

## G8 summit marked by impotence and division

**නික් බීම්ස් විසිනි**

**2008 ජුලි 09**

විවාදයට තුඩුදිය හැකි වුවත්, ගෝලීය ධනේශ්වර ආර්ථිකය දෙවන ලෝක සංග්‍රාමයේ පටන් මුහුන දී ඇති බරපතලම අර්බුදය හමුවේ, ප්‍රතිපත්ති සම්බන්ධීකරනය පිලිබඳව ලොව ප්‍රමුඛ ජාතින්ගේ මැදිහත්වීම මෙතරම් දැඩි අවශ්‍යතාවක් ලෙස වෙන කවරදාකවත් මතුවී නොතිබුනි.

එහෙත්, අවපාතයේ පෙර නොවූ විරූ තර්ජනය ද, තෙල් හා ආහාර මිල ගනන් ඉහල යාම ද, දේශගුනික විපර්යාස ද මගින් එල්ල කර ඇති තර්ජනය හමුවේ, ජපානයේ හොකයිඩෝ දූපතෙහි මෙම සතිය තුල පවත්වන ලද ලොව ප්‍රධාන කාර්මික ජාතීන්ගේ රැස්වීම තුල කැපී පෙනෙන ආකාරයෙන් නොදැකිය හැකි වූයේ ද එක්සත්කම හා සහයෝගීතාවය යි. තිරයට පිටුපස බොහෝ සාකච්ඡාවන්ගෙන් පසුව, ජී8 සමුලුව අවසානයේ දී එකඟවූයේ "2050 වන විට ගෝලීය කාබන් නිකුතුව සියයට 50 කින් වත් පහත හෙලීම" පිලිබඳ "දැක්මක් " සඳහා ප්‍රධාන කාර්මික බලවතුන්ගේ ඒකාබද්ධ ප්‍රකාශනයක් නිකුත් කිරීමට ය. කෙසේ වෙතත්, ඉන්දියාවේ හා චීනයේ කැපවීම නොතිබුනු තත්වය තුල කිසිදු ඉලක්කයක් නියම කිරීම ප්‍රතික්ෂේප කල එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් බුෂ්ගේ එකඟතාවය ලබාගැනීම් වස්, "මෙම ගෝලීය අභියෝගය ජය ගතහැක්කේ ගෝලීය සහයෝගීතාවක්, විශේෂයෙන්ම සියලු ප්‍රධාන ආර්ථිකයන්ගේ දායකත්වයෙන් පමනක් බව වටහාගනිමින්" යන ව්‍යතිරේකයක් ප්‍රකාශනයට ඇතුලත්ව තිබේ.

ප්‍රකාශනය, ගෝලීය දේශගුනික විපර්යාස පාලනය කිරීම සඳහා අවශ්‍ය තරමට වඩා බොහෝ පසුපසින් නතරවී ඇතිබව ප්‍රකාශ කරමින් විද්‍යාඥයෝ එය ඉවත දැමූහ. "කාර්මික රටවලට, තම රටවල ම කාබනික විමෝචනය පිටුදැකීමේ ඕනෑකමක් තිබුනේ නම් හා ඉක්මනින්ම එයට විසඳුම් සෙවීමේ සිය කැපවීම වඩාත් සංයුක්තව ප්‍රකාශ කලේ නම්, මෙහි දී ඔවුන්ට ප්‍රගතියක් අත්කර ගතහැකිව තිබුනි. එහෙත් ඔවුන්ට ඒ පිලිබඳව එකඟතාවක් නොතිබුනි."

"අවධියෙන් සිටින විද්‍යාඥයෝ" නම් සංගමයේ ප්‍රකාශකයෙකු වන ඒඩ්න් මියර් මෙසේ පැවසීය: " 2050 වසරේදී පහත හෙලන ආකාරය හා ඒ කුමන වසරක් පදනම් කරගෙන ද යන්න පිලිබඳව ඔවුන්ට වඩාත් සංයුක්ත විය හැකිව තිබුනි. එහෙත් ඒ පිලිබඳව ඔවුන් අතර එකඟතාවක් නොවීය." නිව් යෝර්ක් හි නාසා අභ්‍යවකාශ අධ්‍යයනය පිලිබඳ ගොඩාඩ් ආයතනයේ දේශගුනය පිලිබඳ ප්‍රමුඛ විද්‍යාඥයෙකු වන ජේම්ස් හැන්සන් ප්‍රකාශ කලේ "තමන්ගේ පාලනය යටතේ නොමැති දේශගුනික ව්‍යසනයන්, අපගේ දරුවන්ට ද අත්කරදීම සඳහා ඔවුන් පියවර ගනිමින් සිටින බවට ප්‍රකාශනයෙන් සහතිකයක් දීම පමනක්" බවයි.

ජී-8 සමුලු ප්‍රකාශනය, ඉදිරි දශකය තුල ඉතා වැදගත් යයි සැලකෙන කාබන් විමෝචනය පහත හෙලන බවට කිසිදු සහතිකයක් දීමට අසමත්ව ඇත. එක්සත් ජාතීන්ගේ දේශගුනික විද්‍යාඥයන්ගේ මන්ඩලයෙහි සභාපති රාජේන්ද්‍ර පචාවුරි මෙසේ පැවසීය: "අප, විමෝචනය කඩිනමින් පහත හෙලීමට පියවර ගන්නා තාක් දුරට තවත් දශකයක් හෝ ආසන්න කාලයක් තුල ක්‍රියාත්මකවීමට පටන් ගන්නා උෂ්නත්වය වැඩිවීම හා වඩාත් බැරෑරුම් සමහර ප්‍රතිවිපාක දුරලීමට ඇති හැකියාව ඉමහත්ය."

ප්‍රකාශනය, බ්‍රසීලය, චීනය, ඉන්දියාව හා මෙක්සිකෝව වැනි රටවලින් සැදුම්ලත් ඊනියා දියුනුවන රටවල ජී-5 කන්ඩායමේ ක්ෂනික දෝෂ දර්ශනයට ලක් විය. ජී8 කන්ඩායම සමඟ ඔවුන් අද හමුවීමට නියමිතය.

"සංවර්ධිත ජාතීන්ගේ මඟ නොහැරිය හැකි වගකීම් සංවර්ධනය වෙමින් පවතින රටවල් මත පැටවිය නොහැකිය"යි මෙක්සිකානු ජනාධිපති ෆිලිප් කොල්ඩ්රොන් ප්‍රකාශ කලේය.

දකුනු අප්‍රිකානු පරිසර ඇමති මාතිනාවුස් ෂෝල්ක්වික් ජී8 ප්‍රකාශනය හැඳින්වූයේ "මූලද්‍රව්‍යයන් රහිත සටන් පාඨයක්" ලෙසය.

"ප්‍රකාශනය, පියවරක් ඉදිරියට තැබීමක් ලෙස පෙනීයාහැකි වුවත්, දේශගුනික විපර්යාසයන්ගේ අභියෝගයට මුහුන දීමේදී අවශ්‍ය කෙරෙන දායකත්වයෙන් පිටුපසට යාමක් ලෙස එය අපගේ කනස්සල්ලට හේතුවේ. එයට පලදායී හා විශ්වාසනීයත්වයක් ලැබෙන්නේ දිගුකාලීන අරමුන සඳහා පදනම් වර්ෂයක් ඇත්නම් පමනි. එය අභිලාෂවත්

මධ්‍යවාර ඉලක්කයන් හා ක්‍රියාවන්ගෙන් ශක්තිමත් කල යුතුය" යි ඔහු ප්‍රකාශ කලේය.

කුමන ආකාරයකින් හෝ එවන් පොරොන්දු ලබා දුන්නත්, ඒවා ලෝකයේ දුප්පත්කම පිලිබඳව දුන් පොරොන්දුවලට වඩා වෙනස් නොවනු ඇත. තෙවසරකට පෙර ස්කොට්ලන්තයේ ග්ලෙනීගල්ස්හි බොහෝ පම්පෝරි මධ්‍යයේ පවත්වන ලද රැස්වීමේදී ජී-8 නායකයෝ වසර 2010 වන විට අප්‍රිකාවට දෙන ආධාර ඩොලර් බිලියන 25 කින් වැඩි කිරීමට එකඟ වූහ. හොකයිඩෝ රැස්වීම පවත්වන අවස්ථාව වන විටත් ඉන් ලබාදී තිබුනේ යාන්තම් සියයට 14 ක් පමනක් බව හෙලිදරව් විය.

## ලෝක ආර්ථිකය

ලෝක ආර්ථිකය පිලිබඳ ජී-8 පොරොන්දු, දේශගුනික විපර්යාස පිලිබඳ එහි පොරොන්දුවලට වඩා නිශ්චිත නොවේ. 1975 දී මෙම සංවිධානය පිහිටුවන ලද්දේ, 1973-74 වසරවල තෙල් මිල කම්පනයේ ප්‍රතිපල වශයෙන් හටගත් අවපාතය හා මූල්‍ය හැල හැප්පීම් මඟින් ජනිත කල ගැටලුවලට මුහුන පෑම සඳහා සම්බන්ධීකරන ක්‍රියාවලියක් වර්ධනය කිරීමේ අරමුනෙන්ය. දශක තුනහමාරක් ගතවූ තැන, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් අංග ලක්ෂනය කල, ලෝක අවපාතයේ පටන් ඇතිවූ බරපතලම මූල්‍ය අර්බුදයට ලෝක ආර්ථිකය මුහුනපා සිටියදී එවන් ක්‍රියාවලියක් බෙහෙවින්ම අවශ්‍යව තිබුනි.

එහෙත් ජී-8 ප්‍රකාශනයේ සංයුක්ත පියවර කිසිවක් අඩංගුව නැත. "යටිතලයේ අවදානම් අඛන්ඩව පවතිද්දී හා පාරිභෝගික භාන්ඩ විශේෂයෙන්ම තෙල් හා ආහාර මිල ගනන් ඉහල නැඟීම පිලිබඳ බරපතල උත්සුකය" ප්‍රකාශ කරමින් "අනිශ්චිතභාවය" ට මුහුනපා ඇති ලෝක ආර්ථිකය ගැන සඳහන් කිරීමෙන් පසුව ප්‍රකාශනය මෙසේ කියා සිටියි. "අපගේ ද ගෝලීයව ද ආර්ථික වර්ධනය හා ස්ථාවරත්වය සහතික කිරීම සඳහා, තනි තනිවත් සාමූහිකවත් අඛන්ඩව සුදුසු පියවර ගැනීමට අප අධිෂ්ඨාන කරගෙන සිටිමු."

ගෝලීය අසමතුලිතයන් දුරලීම සඳහා යුආන් මුදලේ හුවමාරු අනුපාතිකය ඉහල යාමට ඉඩහරින ලෙසට කරන සැඟවුනු ඉල්ලීමක් ප්‍රකාශනය මඟින් චීන ආන්ඩුව වෙත යොමුකර තිබේ. "විශාල හා තව තවත් වැඩිවන ජංගම ගිනුම් අතිරික්තයන් සහිත සමහර නැඟීඑන ආර්ථිකයන් අවශ්‍ය සීරු මාරු කිරීම් සිදුවන තෙක් ඔවුන්ගේ හුවමාරු අනුපාතික කඩිනමින් වෙනස් කිරීම තීරනාත්මකය" යි ප්‍රකාශනය සඳහන් කරයි. " සමහර" යන වචනය ඇතුලත්ව තිබීම පසුගිය වසරේ නිකුත්කල ප්‍රකාශයෙන් කැපීපෙනෙන වෙනසක් සලකුනු කරයි. එහි සරලව සඳහන් වූයේ පොදුවේ " නැඟීඑන ආර්ථිකයන් ලෙසය.

හුවමාරු අනුපාතික ප්‍රශ්නය වඩාත් ගැඹුරෙහි පවතින ගැටලුවල රෝග ලක්ෂනය පමනි. බුෂ්ගේ ප්‍රකාශකයෙකු සඳහන් කලේ රැස්වීම ආරම්භයේ පටන්ම බුෂ්ගේ මනාපය වූයේ "ශක්තිමත් ඩොලරය" ක් කෙරෙහිය. කෙසේ වෙතත්, ඒ සඳහා එක්සත් ජනපද පොලී අනුපාතික ඉහල නැංවීමක් අවශ්‍ය කෙරේ. එය නිසැකව ම පාහේ එක්සත් ජනපදයේ මෙන්ම ගෝලීයව ද නව මූල්‍ය අර්බුදයක් පනගන්වනු ඇත. අනෙක් අතට ඩොලරයේ අගය වැඩිවීම සඳහා අනෙකුත් කලාපයන්හි විශේෂයෙන්ම යුරෝ කලාපයෙහි පොලී අනුපාතික පහත හෙලීමක් අවශ්‍ය කෙරේ.

එහෙත් පොලී අනුපාතික අඩුකිරීම වෙනුවට යුරෝපීය මධ්‍යම බැංකුව ගෝලීය උද්ධමනකාරී පීඩනයන්ට මුහුනදීම සඳහා සාපේක්ෂව දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කරයි.

ජී-8 හි බෙලසුන්කම පුද්ගල නායකයන්ගේ හා ආන්ඩුවල නොව ලෝක ආර්ථිකයේ සිදුව ඇති ඉමහත් වෙනස්කම්වල නිමැවුමකි. ජූලි 07 වන දින ෆිනෑන්ෂල් ටයිම්ස් හි පලවූ ප්‍රකාශයකට අනුව ජී-8 තමන්ගේ ම ඉරනම පිලිබඳ නිර්මාපකයා නොව "වෙනත් ඉසව්වක බලවේග හා ප්‍රතිපත්ති" මඟින් තැලුම් කෑමට ලක්වූ අයෙකි.

"ජී-8 ලෝක ආර්ථික නිමැවුමෙන් හරි අඩකට ම පාහේ වගකියන නමුදු, ආර්ථික වර්ධනයෙන් සියයට 70 ක් ම නිපැයෙන්නේ සංවර්ධනය වෙමින් පවතින හා නැඟී එමින් තිබෙන ආර්ථිකයන් විසින් ය. එහි ගතිකය ජී-8 පරිමාව ඉක්මවා යයි. සියයට 10 ක ආර්ථික වර්ධනයේ බලය මත චීනය පමනක්, සෑම වසරකම ලෝක ආර්ථික වර්ධනයට එක්සත් ජනපදය හා සමාන දායකත්වයක් සපයයි."

ජී-8 සාමාජිකයන් තමන් හඳුන්වා ගැනීමට කැමති "ප්‍රමුඛ කාර්මික ජාතීන්" යන වැකිය ගිලිහී යාම එක්සත් ජනපද ආර්ථික පරිහානිය විසින් ඉටුකල දෙයකි. ජූලි 03 වන දින බ්ලූම්බර්ග් ප්‍රවෘති ප්‍රකාශයකින් එලි දැක්වූයේ "බුෂ් පාලන කාලය තුල යුරෝවට සාපේක්ෂව ඩොලරය සියයට 41 කින් වැටීම, ඇමරිකානු අධිපත්‍ය නඟාසිටුවීමට කැපවූ පරිපාලනයක ආර්ථික සමරු එලකයක් ලිවීම වැනිය."

ඊටත් වඩා කර්කෂ ප්‍රකාශයක් ප්‍රකට බ්‍රිතාන්‍ය ඉතිහාසඥයෙකු හා මාධ්‍ය වේදියෙකු වනමැක්ස් හේස්ටිංග්ස් විසින් ලියා ගාඩියන් පත්‍රයේ පලකර තිබුනි. හොකයිඩෝ රැස්වීම සිහිගන්වන්නේ සෙනසුරාදා රාත්‍රියේ දේශපාලන හදිසි අනතුරු වාට්ටුවක දසුන්යයි" ඔහු ලිවීය.

"මිහිතලයේ ශ්‍රේෂ්ඨ තම ජාතියේ ජනාධිපති වන බුෂ්, අපකීර්තියට පත්ව එහැම පිටින්ම පුස්කාපු අයෙකි. ගෝඩන් බ්‍රවුන් නායකත්වය දෙන ආන්ඩුවේ ම

බොහෝදෙනෙකු ඔහු වලකට පැන නොපෙනී යනු දැකීමට කැමැත්තෙන් සිටිති. ලෝකය හමුවේ බැරෑරුම් මුහුනක් පෙන්වීමෙහිලා ඉතාලියට අවස්ථාව අහිමි කල මැරවර සංස්කෘතියක සිල්වියෝ බර්ලුස්කෝනි නායකත්වය දරයි. 2012 වන තෙක් ප්‍රංශයේ ජනාධිපතිකම දැරීමේ කීර්තිය භුක්තිවිඳින නිකොලායි සාකෝසි, සිය පලමු වසරේ විගඩම් වලින් තම බල පදනමට දරුනු හානි සිදුකර ගත්තේය. රුසියාවේ නව ජනාධිපති ඩිමිත්‍රි මෙඩ්විඩෙව්, ඔහු සිතිය යුත්තේ කුමක්දැයි පෙන්වාදීමට ව්ලැඩිමීර් පූටින් නොමැති වීමෙන් කිසිවක් කර කියාගත නොහැකිව සිටියේය.

ලෝක දේශපාලන නායකත්වය පිලිබඳ හේස්ටිංග්ස්ගේ උත්සුකය මතුකරනු ලැබුවේ, " දේශගුනික විපර්යාස පිගිබඳ සිත් කම්පාවට පත්කරන තොරතුරු ද" ඇතුලුව ලෝකයේ දුප්පත්කම හා පිම්මේ ඉහල යන තෙල් හා ආහාර මිල හමුවේ ආර්ථික මන්දගාමිත්වය වැනි "නූතන අවධියේ උග්‍ර ප්‍රශ්න" විසඳීමට අසමත්වීම ගැන ජී-8 වෙත එල්ල වූ චෝදනාවන්ගෙනි.

කෙසේවුවද, කොයිතරම් අදාල හා වැදගත් වුවත් කිසිදු අරමුනක් වෙනුවෙන් ජාත්‍යන්තර ගනපූරනය ලබාගැනීම එන්ට එන්ටම දුෂ්කර වන කර්තව්‍යයකි. මෙය, එක්සත් ජනපදයට එහි අධිකාරය අහිමිවීම පමනක් නොව ගෝලීය වාදය කිසිදු ජාතියකට තීරනාත්මක ක්‍රියාවක් සඳහා එකඟත්වයක් ඇති කර ගැනීම අතිශය දුෂ්කර කාර්යයක් බවට පත් කර තිබීමේ" ප්‍රතිවිපාකය ද පිලිබිඹු කරයි.

"ශක්තිමත් එක්සත් ජනපද නායකත්වය අනුගමනය කිරීමේ අවශ්‍යතාවය තේරුම ගෙන සිටි" සීතල යුද්ධ අවධියේ ධනේශ්වර සමාජයන්ට දේවල් බොහෝ පහසු විය. "මුල් බැසගත් හුරුපුරුදු හා විනාශකාරී ලෙස යල් පැන ගිය ජාතික අවශ්‍යතාවන් ඉක්මවා යන, සියල්ලන්ට පොදු උපද්‍රවයන්ට එරෙහිව පොදු ක්‍රියාමාර්ගයකට යාමේ අවශ්‍යතාව ජී-8 වැනි මන්ඩලවල සාමාජිකයන්ට ඒත්තු යාමට පෙරාතුවම ගෝලීය අසීරුතා බෙහෙවින් නරක අතට හැරෙනු ඇතැයි" හේස්ටිංග්ස් අනාවැකි පලකරයි.

ජාතික අවශ්‍යතාවන් තුල මුල් බැසගැනීමේ අන්තරාය පිලිබඳව ලෝක සිදුවීම් මඟින් ද, ලෝක නායකයන් දැනුවත් කරනු ඇතැයි යන හේස්ටිංග්ස්ගේ බලාපොරොත්තුව වනාහි, ඉංග්‍රීසි ගුරුවරයෙක් රස්තියාදුකාර සිසුන්ගේ පංතියකට මොලය පාදා දීමට දරන උත්සාහයකටත් වඩා අයථාර්තවත්ය. වත්මන් ජී-8 රැස්වීම තුල ප්‍රදර්ශනය වූ ආකාරයට ගෝලීය ආර්ථික හා පාරිසරික ගැටලු ඔවුන් වෙත ලඟාකරනවා ඇත්තේ ජාත්‍යන්තර එක්සත්කම හා සහයෝගය වෙනුවට, ජාතික කතරේ අවමංගතවීම හා කාකොටා ගැනීම්ය.

ඒ මන්ද යත්, බෙදීම්, පුද්ගලික දේශපාලඥයන්ගේ නිමැවුම් හෝ අවබෝධයේ මඳකම නිසා හටගත් දේ නොව, ලෝක ධනවාදී පද්ධතියේ ජාතික රාජ්‍ය ව්‍යුහය තුලම මුල් ඇද තිබෙන නිසාය.

© www.wsws.org